# වල්වි සහ වලිසියො

පී. ජී. ගෞරවී උමයංගනා අත්තනායක

# චිල්ලී සහ චිලීසියා

පී. ජී. ගෞරවී උමයංගනා අත්තනායක

Grade 7- B

Mahamaya Girls College, Kandy

Published on 10.05. 2026

ISBN No. 978-624-211-430-9

# පිදුම

ලේ කිරි කර පොවා

මා හැදු මාගේ මෑණියන්ටත්

දහඩිය වගුරුවා මා දැඩි කළ පියාණන්ටත්

සිප් කිරි පොවා මා

ඉහළට ඔසවා තබන මාගේ

ගුරු මෑණියන්ටත්

මේ පොත හද බැතින් පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

## සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

ඔන්න එකෝමත් එක කාලයක හර්මියා කියලා ලස්සන රටක් තිබුණා. මේ රටේ තිබුණා ස්ට්‍රෝබෙරි උද්‍යාන, මල් වතු වගේම පොකුණු, දිය ඇලි ආදිය. මේ රටේ හිටියා රජ කෙනෙකුයි රැජිනියකුයි. මේ රජතුමාගේ නම හර්කියුලිස්. ඉතින් රැජිනගේ නම තමයි ක්‍රිස්ටිනා. මේ රජතුමයි රැජිනයි බොහෝම හොඳින් මේ රට පාලනය කළා.

මේ රජතුමා රටේ ජනතාවට හරිම ආදරෙයි. ඒ වගේම මේ රැජිනත් රටේ ජනතාවට ගොඩක් ආදරෙයි. හරිම කරුණාවන්තයි.


ඔන්න ටික කාලයක් යද්දී අලුත් කුමරියෙකුත් මේ රජ පවුලට එකතු වෙනවා. මේ කුමාරිගේ නම එලීසියා. මේ කුමරිය හරිම ලස්සනයි. මැයගේ කොණ්ඩය රත්තරන් පාටයි. ඇස් නිල් පාට පළිඟු බෝල වගෙයි. රජතුමයි රැජිනයි වගේම රටේ මිනිස්සුයි ඔක්කොලාම මේ එලීසියා කුමරියට ආදරය කලා.

මේ එලීසියා කුමරිය ඉපදුණු දිනයේදී ම එල්වි කියන දුප්පත් බිලිඳිය ද උපන්නා. මැයගේ මව ඇය ඉපදී මාස 4 කින් මිය ගියා.



එල්වි හැදුනේ එයාගේ අත්තම්මයි තාත්තයි එක්ක. එල්විගේ අත්තම්මා ඉස්සර රජ මාළිගයේ වැඩට ගියා. එතකොට එල්විගේ තාත්තා වඩු කාර්මිකයෙක්. මොවුන්ට පුංචි නිවසක් සහ කුඩා කඩයක් ද තිබුණා. එල්වි සහ එයාගේ පවුලේ අය ජීවත් වුණේ පළතුරු සහ එළවළු මේ කඩේ විකුණලා ගන්න මුදලෙන් තමයි.

එල්විගේ කොණ්ඩේ, ඇස්, හැඩය ඔක්කෝම පුංචි එලීසියාගේ වගේමයි. ඒත් එලීසියාට තිබ්බ නපුරු, උඩඟු ගතිගුණ එල්විට තිබුණේ නෑ. එයා හරිම අහිංසකයි. කරුණාවන්තයි. මේ දෙන්නා කාලයත් එක්කම ටිකෙන් ටික ලොකු වුණා. ඒ වගේම හරිම ලස්සන වුණා.



හැබැයි මේ එලීසියා නම් හරිම නපුරු කුමාරිකාවක්. ඒ කුමරිය උඩඟු වුණා. නපුරු වුණා. ඒත් එල්ව් නම් කවදාවත් එහෙම වුණේ නෑ. එයා එයාගේ ලස්සන නිසා තවත් හොඳ වැඩ කළා. එල්ව් එයාගේ ලස්සන කාටවත් පෙන්නුවේ නෑ. එලීසියා නම් එයාගේ ලස්සන නිසා තවත් උඩුගු වුණා. තව තවත් නපුරු වුණා. එයා එයාගේ සේවිකාවන්ට, අම්මට, ඒ කියන්නේ රටේ රැජිනට එරෙහි වෙලා තනි තීරණ ගත්තා වගේම ඇයගේ පියාටත් එරෙහිව වැඩ කටයුතු කළා.




එල්වි එයාගේ අත්තම්මත් එක්ක එළවළු විකුණන්න කඩේට ගියා. එයා ගොඩක් මහන්සි වුණා අත්තම්මටයි තාත්තටයි උදව් කරන්න. එයා සතුන්ටත් ගොඩක් ආදරෙයි. ගස් කොළන් වලටත් පරිසරයටත් හරිම ආදරෙයි. ඒක නිසාම පරිසරයත් ඇයව ආරක්ෂා කරනවා.

එයාට චූටි පූස් පැටියෙක් හිටියා. එයාගේ නම කිකී. එයා ලස්සනයි. සුදුයි. එලීසියාට ආදරයට කවුරුත් කියන්නේ එලී කියලා. එයා ඒ නමට ආසයි. එයාටත් සුදු පූසෙක් හිටියා. එයාගේ නම පෝලි. එයත් කිකී වගේම හරිම හොඳයි. මේ පූසා කිකීගේ යාළුවෙක්. දවසක් මේ පෝලිට හම්බවුණා එයාගේ ගෙදරින් රසම රස කෑමක්. එයා ඒක කිකී එක්ක බෙදාගෙන කෑවා. ඒ වගේම දවසක් කිකීට මාළුවෙක් ලැබුණා. එයා ඒක පෝලි එක්ක බෙදාගත්තා.

දවසක් එල්වි පාරේ වැටිලා හිටපු ආච්චි කෙනෙකුව නැගිට්ටවලා තුවාල වලට බෙහෙත් දාලා එයාට එල්වි ගාව තිබුණු කෑම එකත් දුන්නා. ඒ ආච්චි ඒක සතුටින් භාරගත්තා. ආච්චි ඒක කාලා එල්විට ස්තූති කරලා එතැනින් යන්න ගියා. එල්විත් සතුටින් ගෙදර ගියා. එයා අද කරපු යහපත් ක්‍රියාව අත්තම්මාටත්

තාත්තාටත් කිව්වා. එයාලා එල්විව ගොඩක් අගය කලා.

එල්වි එයාගේ කාමරයට ගියා. එයාගේ පුංචි ඇඳේ ඉඳගත්තා. එයා කරපු හොඳ ක්‍රියාව මතක් කර කර ඉන්නකොට ජනේලයෙන් එයාට පෙනුනා අම්මෙකුයි දුවෙකුයි පාරේ අයිනෙන් අත් අල්ලගෙන හරි සතුටින් යනවා. එල්විට දුක හිතුණා. එයාට එයාගේ අම්මා මතක් වුණා. එයාට ඇස් වලින් කඳුළු ගලාගෙන ආවා. එතකොට අත්තම්මත් එතැනට ආවා. ඉතින් අත්තම්මා එල්වි අඬනවා දැකලා එයා ළඟින් වාඩි වුණා.




“ඇයි පුතේ අඬන්නේ?” කියලා අත්තම්මා ඇහුවා.

“මට මගේ අම්මව මතක් වුණා ආත්තම්මේ”

කියලා එල්වි කිව්වා.

අත්තම්මාගේ එයාගේ හිත සැනසුවා. එල්වි හිත හදාගෙන එළියට ගියා. එතකොට දැක්කා පාරේ මුව පැටියෙක් වැටිලා ඉන්නවා. එයාට හොඳටම තුවාල වෙලා. ලේත් එනවා. එල්වි මුව පැටියා වඩාගෙන ගෙදර අරගෙන ගියා. එයාට බෙහෙත් කළා. ටික දවසකින් මුව පැටියාට සනීප වුණා. ඊට පස්සේ එයාට ආයෙත් එයාගේ අම්මා ළඟට යන්න පුළුවන් වුණා.



මේ අතරේ රජ මාළිගාවේ කුමරියගේ රත්තරන් සපත්තුව නැතිවෙලා. රජ කුමාරි සපත්තුව හොයනවා.



''කෝ මේ කවුරුත් දැක්කේ නැද්ද මගේ සපත්තුව.''

එයා සේවකයින්ටත් කෑ ගහනවා. හැමෝම කලබලයෙන් සපත්තුව හොයනවා.

රාජ කුමාරිගේ අම්මා මෙහෙම කියනවා.


''පුතේ එලීසියා, ඔයා කලබල වෙන්නේ නැතුව සන්සුන් වෙලා ඕක හොයන්න. කලබල වෙලා හොයාගන්න බෑනේ.''

අම්මා එහෙම කිව්වම එලීසියා කුමරියට තවත් තරහ ගියා. ඇයගේ කෑම වේලාව ඇවිත් නිසා ඇය නිල් පාට සපත්තු දෙක දාගෙන කෑමට යන්න ලෑස්ති වෙලා,

''මම එනකොට සපත්තුව හොයලා තියන්න ඕනෑ'' යි කියමින් කෑමට යන්න ගියා.

කාලය ගෙවී ගියා. දැන් එල්වියි එලීසියයි දෙන්නම තරුණ වයසේ ඉන්නේ. එල්වි ලොකු වෙන්න ලොකු වෙන්න එයාගේ පවුලටත් වියදම වැඩිවුණා. ඒක නිසා එයා වැඩකට යන්න තමයි

ලැහැස්ති වුණේ. අත්තම්මයි තාත්තයි දෙන්නම මේ අදහසට අකමැති වුණත් පස්සේ එල්විගේ අදහසට එකඟ වුණා.



ඉතින් එල්විගේ බල කිරීමට එල්වි රජ මාළිගාවේ වැඩට ගිහින් බාර දුන්නා. එයාට තිබුණේ  රජ මාළිගාවේ උයන පිරිසිදුව තියාගන්න එක. කුමාරිකාව ළඟට ගිහින් අවසර අරගෙන, ගිහින් එයා දැන් වැඩ පටන් ගත්තා. ටික කාලයක් යනකොට එල්වි හොඳට වැඩ පුරුදු වුණා.

දවසක් දා එලීසියා කුමරිය උයනේ ඇවිදින්න ගිය වෙලාවේ එල්වි ලිස්සලා වැටුණා. එලීසියා කුමරිය ඉතින් මේක දැකලා හරියට හිනාවුණා. එල්විට ටිකක් තුවාල වෙලා. එල්වි දවස් දෙක තුනක් මාළිගාවට ආවෙත් නෑ. එල්වි ආයෙත් මාළිගාවට ආවට පස්සේ එලීසියා කුමරිය ආයෙත් හැමොත් එක්කම ඒක ගැන කිය කියා හිනා වෙන්න වුණා.

එල්විට මාලිගාවේ හිටියා හොඳ යාළුවෙක්. එයාගේ නම ජෝර්පියා. එයා හරි හොඳයි. එයා එල්විගේ හිත හැදුවා.

"ඕවා ගනන් ගන්න එපා එල්වී. එයාගේ හැටි ඔහොම තමයි."

දවසක් දා එලීසියා කුමාරි එල්වි වැඩ කර කර ඉන්න තැනට එනකොට ගලක හැප්පිලා වැටුණා. ඉතින් කුමරියගේ කකුල කැඩිලා වගේ. එදා එල්විට එයා හිනා වුණාත් එයාට ඊට වඩා නරක

දෙයක් තමයි අද වෙලා තියෙන්නේ. එල්වි සහ ජෝර්ජියා එකතු වෙලා සේවකයින්ට කියලා එලීසියා කුමරිය වෙදෙක් ගාවට එක්කරගෙන ගියා. එල්විට ටික දවසක් යනකල් ඇඳේම ඉන්න වෙයි කියලා වෙද මහත්තයා කීවා.

එල්වි, එලීසියා කුමරිය හොඳට බලාගත්තා. උපකාර කළා. එලීසියා කුමරියට තේරුණා එල්වි කොයි තරම් හොඳ කෙනෙක් ද කියලා. අනික එල්විට හැමෝම ආදරෙයි එයා කරුණාවන්ත නිසා. මමත් ඒ වගේ වෙන්න ඕන කියලා එලීසියා හිතුවා. ඉතින් එලීසියා වෙනස් වුණා. ඒ දෙන්නා දැන් හොඳ යාළුවෝ. දැන් එලීසියා කුමරිය නපුරු නෑ. උඩඟු නෑ. ඊට පස්සේ මේ දෙන්නා සතුටින් ජීවත් වුණා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN No 978-624-211-430-9